# බටහිර දැනුමේ චින්තනය

බටහිර විද්‍යාව යනු බටහිර නූතනත්වයේ ප්‍රතිඵලයකි. බටහිර විද්‍යාව බිහිවූයේ බටහිර නූතනත්වය හේතුකොටගෙන ය. බටහිර නූතනත්වය යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය පදනම් කර ගෙන බිහි වී ඇත. මෙයින් කියැවෙන්නේ දෙන ලද, එනම් කලින් සිට ම තිබූ, යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයක බටහිර නූතනත්වය බිහි වූ බව නොවේ. යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය ද විකාශයක ප්‍රතිඵලයකි. අපි මේ එකක්වත් මූල හේතුවක් ලෙස නොගනිමු. එසේ මූල හේතු සෙවීම ම යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයෙහි අංගයක් වෙයි. එය අපේ චින්තනයට ආගන්තුක ය. බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය, බටහිර නූතනත්වය, බටහිර විද්‍යාව පමණක් නොව, බටහිර සාහිත්‍යය, බටහිර සංගීතය, බටහිර දේශපාලනය ආදී සියල්ල චක්‍රීය ව එකට බැඳී ඇත. පටිච්ච සමුප්පාදය මෙන් ඒ සියල්ල චක්‍රීය වෙයි. අප චින්තනය ආශ්‍රයෙන් බොහෝ දේ ප්‍රකාශ කරන්නේ ඒ වඩා පහසු නිසා ය. පටිච්ච සමුප්පාදය බොහෝ අවස්ථාවල පටන් ගැනෙන්නේ අවිද්‍යාවෙනි. එහෙත් එයින් කියැවෙන්නේ අවිද්‍යාව මූල හේතුවක් බවවත්, සියල්ල අවිද්‍යාවට ඌනනය කළ හැකි බවක්වත් නොවේ.

බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය බිහි වී ඇත්තේ චින්තන තුනක එකතුවෙනි. නමින් ම කියැවෙන පරිදි ඒ යුදෙව්, ග්‍රීක හා ක්‍රිස්තියානි චින්තන වෙයි. බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයට යුදෙව් චින්තනයෙන් මූලික වශයෙන් ම ලැබී ඇත්තේ වියුක්තය ය. මිනිසාගෙන් වෙන් වූ යෙහෝවා දෙවියන් වහන්සේ යුදෙව් චින්තනය තුළ බිහි වූ වියුක්ත සංකල්පයකි. ග්‍රීක චින්තනයෙන් ඇරිස්ටෝටලීය න්‍යාය හා ස්වසිද්ධි මූලක ක්‍රමය යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයට ලැබිනි. මෙහි ක්‍රිස්තියානි යන වචනයෙන් කියැවෙන්නේ බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය කතෝලික චින්තනයෙන් ලබා ගත් ඇතැම් දෑ ය. එයට කතෝලික යැයි නොකියා, ක්‍රිස්තියානි යැයි කියැවෙන්නේ බටහිර නූතනත්වය තුළ බිහිවූයේ ක්‍රිස්තියානි නමින් හැඳින්වෙන කතෝලික නොවන ක්‍රිස්තියානි ආගම බැවිනි. කතෝලික චින්තනයෙහි වූ සමස්තය යන්න ක්‍රිස්තියානි චින්තනයෙහි නොමැත.

මිනිසාගේ දියුණුව යන සංකල්පය නව ක්‍රිස්තියානි චින්තනයෙහි වෙයි. එමෙන් ම මිනිසාගේ දියුණුව වෙනුවෙන් කැපවීම හා වැඩ කිරීම යන්න ද එහි වෙයි. දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රතිබිම්බය අනුව මවා ඇතැයි කියන මිනිසාට ලෝක ස්වාමීත්වය ලැබී ඇති බැවින් මිනිසාගේ දියුණුව වෙනුවෙන් තව තවත් වැඩ කිරීම, ක්‍රිස්තියානිය ලොව සෑම තැනම පැතිරවීම මිනිසාගේ උරුමය විය. මෙහි දියුණුව යන්නෙන් කියැවෙන්නේ බටහිර නූතනත්වය තුළ වූ දියුණුව බව අමුතුවෙන් කිවයුතු නොවේ. බටහිර සමාජ විද්‍යාඥයකු වූ මැක්ස් වෙබර් මහතා පෙන්වා දෙන්නේ වත්මන් බටහිර දියුණුවට ලූතරවාදී ක්‍රිස්තියානිය දායක වී ඇති බව ය. මෙහි දී ක්‍රිස්තියානිය යැයි කියැවෙන්නේ අපේ වහර අනුව නම් ක්‍රිස්තියානි චින්තනයට ය. වැඩ කිරීම යන්න හා යන්ත්‍ර මෙන් ක්‍රමානුකූල ව වැඩ කිරීම මිනිස් කාර්යයන් බවට පත්විය. වැඩයට අගයක් නියම විය. වැඩ කිරීමට කාලය අවශ්‍ය වෙයි. කාලයට අගයක් නියම වෙන්නේත් මැනීම ඉදිරියට පැමිණෙන්නේත් මේ ක්‍රිස්තියානි චින්තනය තුළ ය. වැඩය ද මැනීමට හැකි විය. කාර්යය යනුවෙන් සංකල්පයක් බටහිර භෞතික විද්‍යාවේ නිර්මාණය වන්නේ එවැනි පසුබිමක ය. කාර්යක්ෂමතාව යන්න ද එවැනි පසුබිමක බිහි වූ සංකල්පයකි. බටහිර භෞතික විද්‍යාව විසින් නිර්මාණය කෙරුණු මේ සංකල්ප නිව්ටෝනීය යාන්ත්‍රිකයට පමණක් සීමා නොවීය. එක් චින්තනයක් තුළ බිහිවන විවිධ විද්‍යා හා දැනුම් පද්ධති අතර ඇත්තේ සම්බන්ධයකි. බටහිර භෞතික විද්‍යාව හා ධනපති ක්‍රමය එකිනෙකට සම්බන්ධ වෙයි. බටහිර භෞතික විද්‍යාවේ කාර්යය, කාර්යක්ෂමතාව, ආදී සංකල්ප බටහිර ධනපති ක්‍රමය තුළ මෙන් ම මාක්ස්වාදයෙහි ද මිනිසුන් අරභයා සඳහන් වෙයි. මාක්ස්වාදයෙහි ඒ සූත්‍රගත වී ඇත්තේ මිනිසාගේ හැකියාව, කාර්යයට සරිලන වැටුප ආදී වශයෙනි. මිනුමක් ලෙස ගෙන වැටුප යන සංකල්පය ඉතා දෘඪ ආකාරයකින් යොදා ගැනෙන්නේ ක්‍රිස්තියානි චින්තනයෙහි ය.

බටහිර නූතනත්වය තුළ අවසාන වශයෙන් ගත් කල මිනිසා ද කොටස්වලින් සෑදි යන්ත්‍රයක් බවට පත්වෙයි. මෙය තව දුරටත් කෙටියෙන් හෝ විස්තර කළ යුතු ය. තාප ගතිකය, ක්වොන්ටම් භෞතිකය, පරිසර විද්‍යාව ආදී කිහිප තැනක හැරුණු විට, මුළු මහත් බටහිර විද්‍යාවේ ම මෙන්, නිව්ටෝනීය යාන්ත්‍රිකයේ ආකෘතිය යොදා ගැනෙයි. නිව්ටෝනීය යාන්ත්‍රිකයෙහි සමස්තය නොසැලකෙයි. පද්ධතියක් සැලකෙන්නේ කොටස්වල එකතුවක් ලෙස ය. මේ කොටස්වල එකතුවෙහි යම්කිසි ආකාරයක ව්‍යුහයක් (ස්ට්‍රක්චර්) වෙයි. ඒ ඒ කොටස් අතර යම් යම් සම්බන්ධතා ඇති අතර ඒ

© Prof. Nalin De Silva

කොටස් කාලයත් සමග වෙනස් වෙයි. පද්ධතිය සමස්තයක් ලෙස නොසලකා එය කොටස්වලට විශ්ලේෂණය කර, කොටස් අතර සම්බන්ධකම් අධ්‍යයනය කිරීම නිව්ටෝනීය යාන්ත්‍රිකයේ ලක්‍ෂණයක් වෙයි. බටහිර විද්‍යාවෙහි සෑම තැනක ම පාහේ මේ ලක්‍ෂණය දැක ගත හැකි ය. එය කතෝලික චින්තනයෙන් නොව, යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයෙන් ගලා එන්නකි. බටහිර ඉංජිනේරු ශිල්පයෙහි මෝටර් රථයක් සැලකෙන්නේ කොටස්වල එකතුවක් ලෙස ය. මෝටර් රථයක එක් කොටසක් වෙනුවට තවත් කොටසක් සවි කළ හැකි ය. මෝටර් රථ සම්බන්ධයෙන් අමතර කොටස් යනුවෙන් සංකල්පයක් ද, ඒවා විකුණන වෙළෙඳුන් ද බිහි වී ඇත.

මෙය බටහිර ඉංජිනේරු ශිල්පයට පමණක් සීමාවුවක් නොවේ. බටහිර වෛද්‍ය විද්‍යාවෙහි ද සිතන්නේ ඒ ආකාරයටම ය. මිනිස් සිරුර විවිධ කොටස්වලින් සමන්විත වුවක් ලෙස සැලකෙයි. ඒ ඒ කොටස්, එනම් අවයව, අතර යම් සම්බන්ධකම් ඇත. එහෙත් ඒ ඒ කොටස්වලට වෙන ම පැවැත්මක් ද ඇත. මෝටර් රථවල එක් කොටසක් වෙනුවට අමතර කොටසක් සවිකළ හැකි ආකාරයට, මිනිස් අවයවයක් වෙනුවට එවැනිම වූ අවයවයක් වෙනත් මිනිසකුගෙන් ලබාගෙන හෝ කෘත්‍රිම ව නිර්මාණය කර හෝ බද්ධ කෙරෙන්නේ මේ චින්තනය තුළ ය. බටහිර සමාජීය විද්‍යාවන්හි දැනට දශක කිහිපයකට පෙර ව්‍යුහවාදය (ස්ට්‍රක්චරලිසම්) යනුවෙන් අංශයක් නිර්මාණය වූයේ එහි දී අදාළ සමස්තය, එනම් සමාජය, කොටස්වලට කඩා ඒ ඒ කොටස් අතර සම්බන්ධකම් ඇසුරින් අධ්‍යයනය කිරීමට යෑමේ දී ය. ව්‍යුහවාදයට පෙර මාක්ස්වාදය එය වෙනත් ආකාරයකින් කර තිබුණි. ඊනියා සමස්තයක් ගැන කෙතරම් කතා කෙරුණ ද, මාක්ස්වාදයෙහි ද සමාජය අධ්‍යයනය කෙරෙන්නේ කොටස්වලට කැඩීමෙනි. සමාජය පංතිවලට කඩා ඒ ඒ පංති අතර සම්බන්ධකම් තුළින් සමාජය විකාශය වන ආකාරයක් ගැන මාක්ස්වාදය සඳහන් කරයි. බටහිර සමාජීය විද්‍යාවන්හි ව්‍යුහවාදයෙහි ඒ ඒ කොටස් අතර සම්බන්ධකම් අධ්‍යයනය කෙරුණ ද, ඒ ඒ කොටස් කාලය සමග වෙනස් වන්නේ කෙසේද යන්න අධ්‍යයනය නොකෙරිණි. කාලය සමග වන ඒ වෙනස අධ්‍යයනය කෙරුණේ පශ්චාත් ව්‍යුහවාදය (පෝස්ට් ස්ට්‍රක්චරලිසම්) යනුවෙන් හැඳින්වෙන ශික්‍ෂණයෙහි ය. එක් අතකින් ගත් කල මාක්ස්වාදයෙහි පශ්චාත් ව්‍යුහවාදී ලක්‍ෂණ දක්නට ඇත.

යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය සම්බන්ධයෙන් තේරුම් ගත යුත්තක් නම් අදාළ චින්තන තුනේ මිශ්‍රණය ඕපපාතිකව පහළ වුවක් නොවන බව ය. ඒ මිශ්‍රණය සඳහා කාලයක් ගත වූ අතර එයට විවිධ දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික හේතු බලපෑවේ ය. බාහිර වශයෙන් ගත් කල කොන්ස්තැන්තිනෝපලය මුස්ලිමුන්ට යටත්වීම, පළමුව මුස්ලිමුන් හරහා හා පසුව සෘජුව ආසියාවෙන් යුරෝපයට දැනුම ලැබීම, අභ්‍යන්තර වශයෙන් ගත් කල රෝම අධිරාජ්‍යය කඩා වැටීම හා යුරෝපීය ජාතික රාජ්‍ය පහළ වීම ආරම්භ වීම ආදී හේතු එයට බලපෑවේ ය. සමස්තය වෙනුවට පුද්ගලිකත්වය ඉස්මතු වීම, මෙහි දී බල පෑ තවත් සාධකයක් වෙයි. දකුණු යුරෝපයේ පළමුව ඇති වූ බටහිර පුනරුදය පිටුපස ද මේ පුද්ගලිකත්වය ඉස්මතු වීම දැක ගත හැකි ය.

බාහිර සාධක හා අභ්‍යන්තර සාධක හමුවේ තව දුරටත් මධ්‍යකාලීන යුරෝපීය කතෝලික චින්තනයට පමණක් සිමා වීමට නොහැකි බව වටහාගත් යුරෝපීයයෝ චින්තනය වෙනස් කර ගැනීමට කටයුතු කළහ. ආසියාවෙන් පැමිණි සාපේක්‍ෂකත්වය ඇතුළු වෙනත් දැනුම් කතෝලික චින්තනය තුළ ගොනු කර ගත නොහැකි ය. එහි දී යුරෝපීයයෝ ආපසු තම ග්‍රීක මුල් කරා ගියහ. අද අපට අපේ ජාතික චින්තනය කරා යෑමට අකුල් හෙළන මෙරට ඊනියා ප්‍රබුද්ධයන් එක්කෝ නොදන්නා එසේත් නැත්නම් අමතක කරන කරුණ නම් යුරෝපීයයන් පුනරුදයේ දී ආපසු ග්‍රීක චින්තනය සොයා ගිය බව ය. එමෙන් ම ඔවුහු යුදෙව් චින්තනයට ගොස් වියුක්තය ද, එහි සඳහන් වන, මිනිසා වෙනුවෙන් ලෝකය මවා ඇත යන්න ද, තම චින්තනය තුළට ගත්හ. රෝම අධිරාජ්‍යයට විරුද්ධ ව කරන ලද අරගලයෙහි දී අධිරාජ්‍යයෙහි බස වූ ලතින් වෙනුවට ඉංගිරිසි වැනි ජාතික භාෂා යොදා ගත්හ. එහෙත් අද ඉංගිරිසිය වෙනුවට ජාතික භාෂා යොදා ගැනීමට ඉඩක් නැත. ඊනියා ලෝක ගම්මානයේ, එනම් ජගත් අධිරාජ්‍යවාදයේ භාෂාව වී ඇති ඉංගිරිසිය එදා ලතින් බසටත් වඩා ලෝකය පුරා ආධිපත්‍යයක් පතුරවා ඇත. අද මෙරට උසස් අධ්‍යාපනය ඉංගිරිසියෙන් පමණක් දීමට කැසකවන්නෝ බොහෝ වෙති. මොවුන්ට එදා ලතින් වෙනුවට ඉංගිරිසිය ගෙන ඒමට කරන ලද සටන අමතක වී ඇත. එසේත් නැත්නම් ඔවුහු ඒ බවක් නොදනිති.

බටහිර විද්‍යාව කතෝලික පල්ලියට එරෙහිව පැන නැගුණේ ඉහත සඳහන් පසුබිම තුළ ය. ඒ නිසා ම කතෝලික පල්ලිය ද බොහෝ කාලයක් යන තුරුම,බටහිර විද්‍යාවට විරුද්ධ විය. අද කතෝලික පල්ලිය බටහිර විද්‍යාවේ ඉතා

© Prof. Nalin De Silva

සංවේදී හැඟීම් දනවන කරුණු ස්වල්පයකට හැරුණුවිට අනෙක් ඒවාට පක්‍ෂ වෙයි. කතෝලික පල්ලිය අද වන විට එතරම් ශක්තිමත් නොවේ. පාප් වහන්සේ එදා කළ වැරදි බෙහෝමයක් වෙනුවෙන් මෑතක දී පාපොච්චාරණය කර ඇත. එපමණකින් නොනැවතී උන්වහන්සේ කියා ඇත්තේ බටහිර විද්‍යාව අද වන විට සම්පත් රැක ගැනීමට හා වැඩි දියුණු කිරීමට කටයුතු කරන බවත් දෙවියන් වහන්සේ මවා ඇති ලෝකය ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි දැන ගැනීමේ වරදක් නොමැති බවත් ය. අද කතෝලික පල්ලියේ නිල මතය වන්නේ සාධාරණ වශයෙන් ගත්කල, දෙවියන් වහන්සේ මැවූ ලෝකය බටහිර විද්‍යාව විසින් තේරුම් ගනු ලැබෙන බව ය.

එසේ වුව ද බටහිර විද්‍යාව කතෝලික චින්තනයට විරුද්ධ චින්තනයක් මත පදනම් වෙයි. මෙයින් එක් ආකාරයකින් ගත් කල කියැවෙන්නේ අද වන විට කතෝලික චින්තනය, යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයට යට වී ඇති බව ය. අනෙක් අතින් පාප් වහන්සේගේ දේශපාලන බලය සම්පූර්ණයෙන් මෙන් ඇංග්ලිකන් ක්‍රිස්තියානියේ, ඇංග්ලො ඇමරිකන් ක්‍රිස්තියානියේ, එනම් ඇමරිකාවේ දේශපාලන බලයට යට වී ඇති බව ය. අද කතෝලික පල්ලියට කළ හැක්කේ ඇමරිකාවට පක්‍ෂපාති වීම සහ ඇමරිකාවේ වුවමනා එපාකම් වෙනුවෙන් කටයුතු කිරීම පමණ ය. අවුරුදු පන්සියයක් තුළ බටහිර නූතනත්වය සමග යුරෝපයේ (හා දැන් ලෝකයේ) ආධිපත්‍යය පාප් වහන්සේගෙන් බ්‍රිතානි රජුට ද, ඔහුගෙන් ඇමරිකන් ජනාධිපතිට ද, මාරු වී ඇත.

බටහිර විද්‍යාව යනු එලෙස යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය සමග බැඳුණු දැනුමක් පමණකි. එසේ නැතිව එහි ඇති ඊනියා විද්‍යාත්මක විධි ක්‍රමයක් නැත. එහෙත් බටහිරයන් අපට කියන්නේ වෙනත් කතාවකි. ඔවුන්ගේ වැයම නම් බටහිර විද්‍යාව මෙතෙක් ලෝකයේ පැවති සියළුම දැනුම් පද්ධතීන්ට වඩා වෙනස් බවත් එය පරයේෂණාත්මක ක්‍රමය හා ඊනියා විද්‍යාත්මක ක්‍රමය මත පදනම් වන බවත් ය. බටහිරයන්ට අනුව ගැලීලියෝ විද්වතා බටහිර විද්‍යවේ පියා ය. ඔවුන් කියන අන්දමට ඔහු බටහිර විද්‍යාවට පරයේෂණාත්මක ක්‍රමය හඳුන්වා දුන්නේ ය. ඔහුට පෙර, බටහිරයන් කියන අන්දමට ඉතාලියේ පමණක් නොව ලෝකයේ කිසිම තැනක, පරයේෂණාත්මක ක්‍රමයක් තිබී නැත. මෙය පට්ටපල් බොරුවක් පමණකි. බටහිර විද්‍යාවෙහි ඔය කියන විද්‍යාත්මක විධි ක්‍රමයක් හෝ පරයේෂණාත්මක ක්‍රමයක් හෝ නැත. එහි ඇත්තේ චින්තන වෙනසක් පමණකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva